# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2010 සැප්තැම්බර් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී.

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[39 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 13.00 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි.

එල්.ඩී.—ඕ. 19/2010

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය ලෙස හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, එහි 31 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන ලෙස සංශෝධනය කිරීම මගින් මෙසේ සංශෝධනය කරනු ලැබේ:—

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එකී ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන්; සහ

(2) එකී ව්‍යස්ථාවේ (3අ) (අ) (i) වන අනුව්‍යවස්ථාවේ—

(අ) "තම ප්‍රථම ධුරකාලය ආරම්භවී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක" යන වචන වෙනුවට, "තම වත්මන් ධුරකාලය ආරම්භවී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය:

එසේවුව ද, මේ ව්‍යවස්ථාව ප්‍රකාර ජනාධිපතිවරයා තෝරාපත්කරගනු ලැබූ අවස්ථාවක, ඔහු එසේ තෝරාපත් කරගනු ලැබිය හැකි යම් තදනන්තර ධුරකාලයක් සඳහා මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (3) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

"(3) ජනාධිපතිවරයා ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර මාස තුනකට එක්වරක් පාර්ලිමේන්තුවට සහභාගිවිය යුත්තේ ය. මේ කර්තව්‍යය ඉටුකිරීමේ දී ඡන්දය දීමට ඇති හිමිකම හැර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සතු සියලු වරප්‍රසාද, පරිහාර සහ බලතලවලට ජනාධිපතිවරයා හිමිකම් ලබන අතර, පාර්ලිමේන්තුව හෝ එහි මන්ත්‍රීවරයන් හෝ සතු යම් වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් වගකිව යුතු නොවන්නේ ය."; සහ

(2) එහි (3) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්:—

"(4) ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර පාර්ලිමේන්තුවේ ඇමතීමටද, පාර්ලිමේන්තුවට සංදේශ යැවීමටද ජනාධිපතිවරයාට අයිතිය තිබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII අ වන ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම.

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය (41අ සිට 41ඌ ව්‍යවස්ථාව දක්වා) මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ අලුත් ව්‍යවස්ථාව ඇතුලත් කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ශීර්ෂය සහ ව්‍යවස්ථාව ඇතුළත් කරනු ලබන අතර එය එහි ශීර්ෂය සහ 41අ වන ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු ය:—

### “විධායකය

### පාර්ලිමේන්තු සභාව

ජනාධිපතිවරයා විසින් උපලේඛනවල සඳහන් කොමිෂන් සභා සහ ධුර සම්බන්ධයෙන් පත්කිරීම් සිදුකරනු ලැබිය යුතු බව.

41අ. (1) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරයා සහ සාමාජිකයන් ද, මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් තැනැත්තන් ද, ජනාධිපතිවරයා විසින් එකී උපලේඛනවල සඳහන් කොමිෂන් සභාවලට සහ ධුරවලට පත්කරනු ලැබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එකී පත්කිරීම් සිදුකිරීමේ දී—

(1) අග්‍රාමාත්‍යවරයා ;

(2) කථානායකවරයා ;

(3) විරුද්ධ පක්ෂයේ නායකවරයා ;

(4) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයකු; සහ

(5) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයකු,

යන අයගෙන් සමන්විත පාර්ලිමේන්තු සභාවක නිරීක්ෂණ ඉල්ලා සිටීම කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත (4) වන සහ (5) වන ඡේද ප්‍රකාර පත්කරනු ලබන නාමිකයන්, එකී නාමිකයන් ඉහත (1) වන, (2) වන සහ (3) වන ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන් අයත් වන ජන කොට්ඨාස නොවන්නා වූ ජන කොට්ඨාසවලට අයත්වන බව සහතිකවන ආකාරයට, නම් කළ යුත්තේ ය.

### I වන උපලේඛනය

1. මැතිවරණ කොමිෂන් සභාව.
2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

3. ජාතික පොලිස් කොමිෂන් සභාව.
4. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව.
5. අල්ලස් හෝ දූෂණ යෝජනා විමර්ෂනය කිරීමේ නිත්‍ය කොමිෂන් සභාව.
6. මුදල් කොමිෂන් සභාව.
7. සීමා නිර්ණය කොමිෂන් සභාව.

## II වන උපලේඛනය

### I වන කොටස

1. අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්.
2. අභියාචනා අධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරුන්.
3. අධිකරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

### II වන කොටස

1. නීතිපතිවරයා.
2. විගණකාධිපතිවරයා.
3. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා. (ඔම්බුඩ්ස්මන්).
4. පාර්ලිමේන්තු මහලේකම්වරයා.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ දී, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු කථානායකවරයා ලෙස තෝරාපත්කරගනු ලබන තෙක් කථානායකවරයා, මේ ව්‍යවස්ථාවේ කාර්යය සඳහා කථානායකවරයා ලෙස දිගටම කටයුතු කළ යුත්තේ ය. ඉන්පසු අලුත් කථානායකවරයා ඉහත සඳහන් පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයකු විය යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිවම පවත්වනු ලබන මහමැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස පිළිගනු ලබන තෙක් විරුද්ධ පක්ෂයේ නායකවරයා, මේ වගන්තියේ කාර්යය සඳහා, විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස දිගටම ධුරය දැරිය යුත්තේ ය. ඉන් පසු අලුත් විරුද්ධ පක්ෂයේ නායකවරයා ඉහත සඳහන් පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයකු විය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට තෝරා පත්කරගනු ලබන තෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වූ, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයා සභාවේ සාමාජිකයන් ලෙස දිගටම කටයුතු කළ යුත්තාහ, ඉන්පසු අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධපක්ෂයේ නායකවරයා විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (4) වන සහ (5) වන ඡේද ප්‍රකාර ස්වකීය නාමිකයන් ලෙස අලුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනකු පිළිවෙලින් නම් කරනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාව යටතේ සංස්ථාපිත පාර්ලිමේන්තු සභාවේ නිල කාලය 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් යම් කාලයක් සඳහා දීර්ඝ විය යුත්තේ ය. තව ද, එම නිල කාලය කෙරෙහි, 70 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමක් මඟින් බලපෑමක් ඇති නොවිය යුත්තේ ය.

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් එකී නිල කාලය තුළ දී පිළිවෙලින් අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් නාමිකයන් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් ඉවත් කිරීම හෝ එකී නාමිකයකුගේ අශක්නුතාවක් ඇති අවස්ථාවක සභාවේ ස්වකීය නාමිකයා ලෙස වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම්කරන ලෙස ජනාධිපතිවරයා විසින් අවස්ථාවෝචිත

පරිදි අග්‍රාමාත්‍යවරයාට හෝ විරුද්ධ පක්ෂයේ නායකවරයාට නියම කිරීම හෝ කරනු ලැබිය හැක්කේ ය. එවැනි අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඉවත් කිරීම හෝ අශක්නුතාව හෝ හේතුවෙන් නිර්මාණය වූ පුරප්පාඩුව පිරවීම සඳහා නම් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින්, ඔහු නම් කරනු ලැබුවේ යම් සාමාජිකයකුගේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ද, සභාවේ එහි සාමාජිකයාගේ ඉකුත් නොවූ කාලපරිච්ඡේදය සඳහා පමණක් එකී සභාවේ එවැනි සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කළ යුත්තේ ය.

(6) ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත්කිරීමේ කාර්යය සඳහා (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිනු ලබන අවස්ථාවේ දී, තමන් විසින් එකී පත්වීම් සඳහා යෝජනා කරනු ලැබූ තැනැත්තන් පිළිබඳ සභාවේ නිරීක්ෂණ එකී ඉල්ලා සිටීමේ දින සිට සතියක කාලයක් තුළ කථානායකවරයා මඟින් තමන්ට දන්වන ලෙස සභාවට නියම කරනු ලැබිය යුත්තේ ය. එකී සභාව විසින් එහි නිරීක්ෂණ එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලය තුළ දැන්වීමට අපොහොසත් වුවහොත්, ජනාධිපතිවරයා විසින් එකී පත්වීම කිරීමට කටයුතු කළ යුත්තේ ය.

(7) පාර්ලිමේන්තුව තුළ නියෝජනය වන්නා වූ යම් පිළිගත් දේශපාලන පක්ෂයක නායකයකු විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස යම් තැනැත්තකුගේ නම යෝජනා කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, ඔහු විසින්, ඉහත නිශ්චිතව සඳහන් කරනු ලැබූ සතියක කාලපරිච්ඡේදය තුළ එයට අදාළව යම් තැනැත්තකුගේ නම කථානායකවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය. එවැනි පත්වීම් කරනු ලබනවිට ජනාධිපතිවරයා විසින් එකී නම් සැළකිල්ලට ගනු ලැබිය යුත්තේ ය.

(8) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හෝ මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත්කරනු ලැබූ යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති ආකාරයට හෝ එකී කාර්යය සඳහා පනවන ලද වෙනත් යම් නීතියකින් සලසා ඇති පරිදි හෝ හැර ඉවත් නොකළ යුත්තේ ය. එවැනි විධිවිධානයන් සාදා නොමැති අවස්ථාවක එකී තැනැත්තා, ජනාධිපතිවරයා විසින් ඉවත් කළ යුත්තේ ය.”.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

“(1) ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන නවදෙනකුට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි මින්මතු කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුතු අතර එකී සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තාහ. ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුත්තේ ය.”;

(2) එහි (4) වන අනුව්‍යවස්ථාවේ “ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් හෝ” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (7) වන අනුව්‍යවස්ථාවේ, "තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත්කරනු ලැබිය යුත්තේ ය." යන වචන වෙනුවට "තාවකාලික සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වන ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වන ව්‍යවස්ථාව, මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:—

"අමාත්‍ය මණ්ඩලයේ සහ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය.

55 (1) අමාත්‍ය මණ්ඩලය විසින්, රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම ඇතුළු, රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

(2) සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම අමාත්‍යවරයා වෙත පැවරෙන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරෙන්නේ ය.

(4) කොමිෂන් සභාව, නීතිය මගින් පිහිටුවනු ලැබ ඇති පරිදි වූ පළාත් රාජ්‍ය කොමිෂන් සභාවල බලතල හෝ කර්තව්‍ය හීනකිරීමත් නොකළ යුත්තේ ය.

(5) කොමිෂන් සභාව විසින්, ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුතු වන්නේ ය. තව ද, කොමිෂන් සභාව විසින් සෑම ලිත් වර්ෂයකදීම එකී ලිත් වර්ෂය සම්බන්ධයෙන් ස්වකීය ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**8.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාවේ එහි (1) වන අනුව්‍යවස්ථාවේ "කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි" යන වචන වෙනුවට "අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**9.** ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 57 වන ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ, "කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි" යන වචන වෙනුවට "අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඊ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**10.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඊ ව්‍යවස්ථාව එහි "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි ඇති "ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු" යන වචන අත්හැරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**11.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා විසින් 41 ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලබන්නේ ය." යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (6) වන අනුව්‍යවස්ථාවේ, "41 ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය" යන වචන වෙනුවට "තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය" යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**12.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) (Vආ) ඡේදය ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**13.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව එහි (1) වන අනුව්‍යවස්ථාවේ “සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය” යන වචන වෙනුවට “සමාජිකයන් තුන් දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**14.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (4) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දැක්වෙන ව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්—

“(4අ) කොමිෂන් සාභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණයක් පැවැත්වීම සඳහා නියමයක් කිරීම සමග හෝ ජනමතවිචාරණයක් පැවැත්වීම නියම කරමින් ප්‍රකාශනයක් කිරීම සමග හෝ ආරම්භවන කාලපරිච්ඡේදය තුළ නිකුත් කරනු ලබන යම් උපමාන—

(අ) අවස්ථාවෝචිත පරිදි අදාළ මැතිවරණය පැවැත්වීම සමග හෝ අදාළ ජනමත විචාරණය පැවැත්වීම සමග හෝ ඍජුව සම්බන්ධ වූ කාරණාවලට පමණක් සීමා විය යුතු බව ; සහ

(ආ) රාජ්‍ය සේවයට අදාළ යම් කාරණයකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ යම් කාරණයකට හෝ ඍජුව සම්බන්ධ නොවිය යුතු බව,

සැකදුරුකිරීම සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ”; සහ

(2) එහි (5) වන අනුව්‍යවස්ථාවේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

“(අ) යම් ගුවන්විදුලි සේවයක් හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙන යන්නෙකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු නැතහොත් ප්‍රකාශකයකු හෝ විසින්

(අ) ඡේදය යටතේ ඔවුන් වෙත නිකුත් කරනු ලැබූ යම් උපමාන පිළිපැදීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම අවස්ථාවෝචිත පරිදි එකී ගුවන් විදුලි සේවය හෝ රූපවාහිනී සේවය පවත්වාගෙන යන්නාගේ හො ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරුගේ නැතහොත් ප්‍රකාශකයාගේ හෝ කාර්යය වන්නේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**15.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ “41 ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන්නාහ” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන්නාහ” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ, “ජනාධිපතිවරයා විසින්, 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින්” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (2) වන අනුව්‍යවස්ථාවේ “ජනාධිපතිවරයා විසින් 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලැබිය හැක්කේ ය” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය” යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ “41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව ජනාධිපතිවරයා විසින්” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව, එහි (5) වන අනුව්‍යවස්ථාවේ ඇති "ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන අත්හැරීම මගින්, සහ එහි (6) වන අනුව්‍යවස්ථාවේ ඇති "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන අත්හැරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**19.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ, "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන්නේය." යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (4) වන අනුව්‍යවස්ථාවේ "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය." යන වචන වෙනුවට "ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව එහි "රාජ්‍ය සේවා කොමිෂන් සභාව" යන වචන වෙනුවට "රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**21.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ "වෙනත් සමාජිකයන් තිදෙනෙක්" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සමාජිකයන් තිදෙනෙක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙසේ සංශෝධනය කරනු ලැබේ:—

"(1) එහි (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

"(1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත

(මේ පරිච්ඡේදයේ “කොමිෂන් සභාව” යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.”;

(2) එහි (4) වන අනුව්‍යවස්ථාවේ “ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ”, යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ” යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 155ඊ සහ155ඊඊ අලුත් ව්‍යවස්ථා ඇතුළත් කිරීම

**23.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ ව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ඇතුළත් කරනු ලබන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ සහ 155ඊඊඊ යන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුත්තේ ය:—

“කොමිෂන් සභාවේ බලතල.

155ඊඊ. පොලිස් නිලධරයකුට හෝ පොලිස් බලකායට එරෙහිව ජනතා සාමාජිකයන්ගෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාරගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල පැවරිය යුතු අතර පාර්ලිමේන්තුව මගින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් සහන සැලසිය යුතු වන්නේ ය. මේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තකුගෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා සහ විමර්ෂණය කිරීම සඳහා කාර්යය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වන්නේ ය.

කොමිෂන් සභාව රීති සෑදිය යුතු බව.

155ඊඊඊ. කොමිෂන් සභාව විසින්, රීති සෑදීම නියමිත වන්නාවූ යම් කාරණා සම්බන්ධයෙන් කලින් කල රීති සෑදීම කළ යුත්තේ ය. එකී සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය.”.

**24.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ වගන්තිය පරිච්ඡින්න කිරීම

**25.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම

**26.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම

**27.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම

**28.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඔ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඔ ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම

**29.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම

"දැනට බලපවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම.

155ඕ. මේ ව්‍යවස්ථාව ආරම්භ වන දිනයේ දී බලාත්මකව පවතින සියලු රීති නියෝග සහ කාර්ය පටිපාටි, මෙය යටතේ රීති, නියෝග සහ කාර්ය පටිපාටි සාදනු ලබන තෙක් බලාත්මක පැවතිය යුත්තේ ය.".

**30.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත්කරනු

ලැබිය යුත්තේය.” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය.” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (5) වන අනුව්‍යවස්ථාවේ “41ඇ වන ව්‍යවස්ථාවට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය” යන වචන වෙනුවට “ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය.” යන වචන ආදේශ කිරීමෙන්.

31. සැකදුරු කිරීම සඳහා මෙසේ ප්‍රකාශ කරනු ලැබේ:— සැකදුරු කිරීම.

(1) මේ පනත ආරම්භවීමට පෙරාතුවම වූ දිනයේදී ධුර දරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 112 වන ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කරනු ලැබූ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව එවැනි සාමාජිකයන් ලෙස දිගටම ධුර දැරිය යුතු අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(2) මේ පනත ආරම්භවීමට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරුන් ද අභියාචනා අධිකරණයේ සභාපතිවරයා සහ වෙනත් විනිශ්චයකාරවරුන් ද, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් ද මේ පනත ආරම්භ වූ දින සිට සහ ඉන්පසු දිගටම ධුර දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔවුන් වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(3) මේ පනත ආරම්භවීමට පෙරාතුවම වූ දිනයේ දී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස, නීතිපතිවරයා ලෙස විගණකාධිපතිවරයා ලෙස, පොලිස්පතිවරයා ලෙස, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) ලෙස සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ලෙස ධුර දරන සෑම තැනැත්තකුම මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු දිගටම ධුර දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔවුන් වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(4) මේ පනත ආරම්භවීමට පෙරාතුවම වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුර දරන තැනැත්තා, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට සහ ඉන්පසුව දිගටම ධුරය දැරිය යුතු අතර, 103 වෙන ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාවක් සංස්ථාපනය කරනු ලබන තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ඔහු වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කළ යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාවක් සංස්ථාපනය කිරීමේ දිනයෙන් පසු ඔහු මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුර දැරීම අවසන් වන්නේ ය :

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින්, එසේ කිරීම යෝග්‍යයයි හෝ අවස්ථාවේ අත්‍යාවශ්‍යභාවය අනුව එසේ කිරීම අවශ්‍යයයි හෝ සලකනු ලබන්නේ නම් මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමට පෙරාතුව කවර හෝ වේලාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබී ඇති කර්තව්‍ය ඉටුකිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ ධුරයට නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුර දරන තැනැත්තකු පත්කරනු ලැබිය හැක්කේ ය.

(5) මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුවම වූ දිනයේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ ස්ථාපිත ජාතික පොලිස් කොමිෂන් සභාව ඉදිරියේ නොවිසඳී පවත්නා පොලිස් නිලධරයන්ගේ පත්වීම්, උසස්කිරීම්, ස්ථාන මාරු, එකී නිලධරයන් කෙරෙහි විනය පාලනය සහ සේවයෙන් පහකිරීම්වලට අදාළ සියලු කාරණා මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන්පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉවත් කර හරින ලද බවට තේරුම්ගත යුතු අතර, ඒ අනුව දිගටම පවත්වා අවසන් කළ යුතු වන්නේ ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ ඡේදවල විස්තරකරනු ලබන කොමිෂන් සභා සම්බන්ධයෙන් කරනු ලැබූ සියලු පත්කිරීම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 අ ව්‍යවස්ථාව ප්‍රකාර පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ධුර කාලය

අවසන්වන දින සිට සහ ඉන්පසු එකී සභාවේ ධුර කාලය අවසන් වූ දිනය සහ මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනය අතර, කාලය තුළ වලංගු සහ බලසහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය රජයේ සේවයේ සාමාජිකයන් විය යුතු අතර, රාජ්‍ය ධුරයක නිලයක් සම්බන්ධයෙන් එවැනි ධුරයකට අදාළ වියයුතු රීතිවලට යටත් විය යුත්තේ ය.

(8) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර මැතිවරණ කොමිෂන් සභාව පත් කිරීමේ සිට සහ ඉන් පසු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIVඅ පරිච්ඡේදයේ කාර්යය සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය එකී කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය ලෙස සලකනු ලැබිය යුතු අතර, මැතිවරණයක් පවත්නා කාලය සඳහා හෝ ජනමත විචාරණයක් පවත්නා කාලය සඳහා ලේකම් කාර්යාලයක් ලෙස කටයුතු කළ යුතු වන්නේ ය.

**32.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ 122 වන ව්‍යවස්ථාව යටතේ සහතිකය**

අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ඉහත පනත් කෙටුම්පත ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන බව මෙයින් සහතික කරමි.

**එස්. අබේසිංහ**
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා.

2010 අගෝස්තු මස 30 දින.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.